# බළන්ගොඩ නගර සභාව
## 2021-11-16 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.11.16**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජ්.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | රී. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. අද දින පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය, බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම, බළන්ගොඩ නගරයේ

පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම, බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව හා බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 යන ක්ෂේත්‍රයන් සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කර පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් 01ක් පමණක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත ලැබී තිබුණි. එහිදී කාල්ඩීන් චාලට් මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ රු. 184,500.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව සඳහා ටෙන්ඩර් පත් 01නිකුත් කර තිබූ අතර, එම ලංසුපත ලැබී තිබුණි. එහිදී කොස්මුල් ගොඩගේ දමයන්ති මල්කාන්ති මහත්මිය ඉදිරිපත් කර තිබූ රු. 14,200.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහි දී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය, බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම හා බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 යන ක්ෂේත්‍රයන් සඳහා ටෙන්ඩර්පත් නිකුත් නොවූ බැවින් ඒ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කර ගන්නා ලදි.

ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම හා බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 යන ක්ෂේත්‍රයන් නැවත වරක් ටෙන්ඩර් කිරීමටත්, එහි දී ද ටෙන්ඩර් නොවුනහොත් අවම ලංසු මුදලින් 10% ක් අඩු කර ටෙන්ඩර් කිරීම සුදුසු බවටත්, පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය හා පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය නැවත වරක් ටෙන්ඩර් කිරීමටත්, එහි දී ද ටෙන්ඩර් නොවුනහොත් මස් කඩ තක්සේරු කර එම තක්සේරු මුදලට ටෙන්ඩර් කිරීමටත් සාකච්ඡා විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තූතිය පුදකරමින් පෙ.ව 11.17 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.